(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **60**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 මාර්තු 23 අඟහරුවාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **උදය ගම්මන්පිල මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණික කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු  සම්පත් අතුකෝරල මහතා

ගරු  තිස්ස අත්තනායක මහතා

ගරු  හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු  අශෝක් අබේසිංහ මහතා

ගරු  (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු  තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු  මායාදුන්න චින්තක අමල් මහතා

ගරු  තවරාජා කලෙයි අරසන් මහතා

ගරු  ජේ. සී. අලවතුවල මහතා

ගරු  නසීර් අහමඩ් මහතා

ගරු  තිසකුට්ටි ආරච්චි මහතා

ගරු  එම්. උදයකුමාර් මහතා

ගරු  යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු  (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු  සංජීව එදිරිමාන්න මහතා

ගරු  අකිල එල්ලාවල මහතා

ගරු  ලලිත් එල්ලාවල මහතා

ගරු  සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  සාගර කාරියවසම් මහතා

ගරු  ෆයිසාල් කාසිම් මහතා

ගරු  ජයන්ත කැටගොඩ මහතා

ගරු  ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  උදයන කිරිඳිගොඩ මහතා

ගරු  ජගත් කුමාර මහතා

ගරු  ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු  කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු  අ. අරවින්ද් කුමාර් මහතා

ගරු  වේලු කුමාර් මහතා

ගරු  කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු  මනෝ ගනේෂන් මහතා

ගරු  ඩයනා ගමගේ මහත්මිය

ගරු  (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු  කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ :** ජනාධිපතිවරයාගෙන් ලැබුණු මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/7

2021 මාර්තු මස 18 වන දින

**ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

“පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 125 හි විධිවිධාන ප්‍රකාරව නවවැනි පාර්ලිමේන්තුව සඳහා සම්බන්ධීකරණ කාරක සභාව-

කථානායකවරයාගේ සභාපතිත්වය ඇතිව;

නියෝජ්‍ය කථානායකවරයා;

නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;

ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා;

විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා; සහ

ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරයන්ගෙන් සමන්විතව ම’විසින් පත්කරනු ලැබේ.”

**3. ලිපි ලේඛනාදිය පිළිගැන්වීම :** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2018 වර්ෂය සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කර එම වාර්තා, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කඳුරට නව ගම්මාන යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 1974 අංක 35 දරන රේගු (සංශෝධන) පනතින් සහ 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනතින් සංශෝධිත (235 අධිකාරය වන) රේගු ආඥා පනතේ 19(අ) වගන්තිය යටතේ තීරු බදු ඉවත් කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 29 දිනැති අංක 2212/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරන ලදී.

එම ලේඛනය, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) විදුලිබල අමාත්‍යවරයා විසින් 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ජල සම්පාදන අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) වැවිලි අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) අධිකරණ අමාත්‍යවරයා විසින් 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 23 දිනැති අංක 2207/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පිළිගන්වා එම නියමය, අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම සඳහා වන යෝජනාව; සහ

(ii) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) විදුලිබල කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු ඩලස් අලහප්පෙරුම මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 2016 වර්ෂය සඳහා සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව;

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2018 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) පන්නිපිටිය, හිරිපිටිය, අංක 63/6 දරන ස්ථානයෙහි පදිංචි සී. ආර්. යටිගම්මන මහතාගෙන් ලැබුණු 2020.12.08 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) කතරගම, පරණ කන්ද පාර යන ලිපිනයෙහි පදිංචි බී. මංගලා ජයන්ති මහත්මියගෙන් ලැබුණු 2021.01.26 දිනැති පෙත්සම;

(ii) කළුතර දකුණ, මහ හීනටියන්ගල, "කෝසල" යන ලිපිනයෙහි පදිංචි බී. ඩී. ඒ. වීරසිංහ මහතාගෙන් ලැබුණු 2020.11.25 දිනැති පෙත්සම;

(iii) බදුරලිය, හැඩිගල්ල ජනපදය යන ලිපිනයෙහි පදිංචි බී. එල්. අභයපාල මහතාගෙන් ලැබුණු 2021.01.26 දිනැති පෙත්සම;

(iv) දොඩම්ගොඩ, රේන්දපොල හන්දිය, අංක 139/1බී දරන ස්ථානයෙහි පදිංචි ඩී. ඩී. චාමින්ද මහතාගෙන් ලැබුණු 2020.11.17 දිනැති පෙත්සම;

(v) ගල්පාත, බටගොඩ, මුල්කඩකන්ද යන ලිපිනයෙහි පදිංචි ඩී. එම්. කමල් කුලසිංහ මහතාගෙන් ලැබුණු 2021.01.27 දිනැති පෙත්සම;

(vi) කළුතර උතුර, විලේගොඩ, සංඝිඳපුර, අංක 178 දරන ස්ථානයෙහි පදිංචි ඩී. ඩබ්ලිව්. මහින්ද ෆොන්සේකා මහතාගෙන් ලැබුණු 2021.01.21 දිනැති පෙත්සම;

(vii) නුගේගොඩ, නාලන්දාරාම පාර, අංක 64 ඒ දරන ස්ථානයෙහි පදිංචි කිංස්ලි ඩෝසන් මහතාගෙන් ලැබුණු 2021.01.05 දිනැති පෙත්සම;

(viii) කළුතර දකුණ, බෝම්බුවල, මණ්ඩඩියා වත්ත යන ලිපිනයෙහි පදිංචි එම්. ඒ. එස්. කරුණාතිලක මහතාගෙන් ලැබුණු 2021.01.16 දිනැති පෙත්සම;

(ix) හල්තොට, ලබුගම, තිබ්බොටුගොඩ පාර, අංක 62/සී දරන ස්ථානයෙහි පදිංචි එන්. කේ. ගුණසේන මහතාගෙන් ලැබුණු 2021.01.15 දිනැති පෙත්සම;

(x) දොඩන්ගොඩ, ගංඉම, ශාන්ත හර්මන් ජනපදය යන ලිපිනයෙහි පදිංචි එස්. ඒ. සකුන්තලා දිල්හානි මහත්මියගෙන් ලැබුණු 2020.09.30 දිනැති පෙත්සම;

(xi) පානදුර, දිබ්බැද්ද, අංක 2/179 දරන ස්ථානයෙහි පදිංචි ටී. එල්. සී. ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2020.11.28 දිනැති පෙත්සම; සහ

(xii) පානදුර, කෙසෙල් වත්ත, සහබෝ මාවත, අංක 77/සී දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. සී. ජගත් ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2021.01.21 දිනැති පෙත්සම

ගරු ජයන්ත සමරවීර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) ගාල්ල, මිලිද්දුව, මොරිස් පාර, අංක 39/23 දරන ස්ථානයෙහි පදිංචි ජී. පී. පී. හේවාවසන් මහතාගෙන් ලැබුණු 2021.01.05 දිනැති පෙත්සම; සහ

(ii) ගාල්ල, ආනන්ගොඩ, විජයානන්ද මාවත, "වානු" යන ලිපිනයෙහි පදිංචි යූ.ජී. ගාමිණී මහතාගෙන් ලැබුණු 2021.01.14 දිනැති පෙත්සම

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) රඹුක්කන, රෝහල පාර, අංක 87/20 දරන ස්ථානයෙහි පදිංචි එලීෂා රාජපක්ෂ මහත්මියගෙන් ලැබුණු 2021.01.15 දිනැති පෙත්සම;

(ii) රඹුක්කන, යටගම, පුවක්මොටේ, අංක ඊ 78/1 දරන ස්ථානයෙහි පදිංචි එච්. ආර්. හීන්බණ්ඩා මහතාගෙන් ලැබුණු 2020.08.20 දිනැති පෙත්සම;

(iii) ගැටහැත්ත, වෙලන්ගල්ල, අංක 72/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි ජේ. ඒ. අබේරත්න මහතාගෙන් ලැබුණු 2021.01.02 දිනැති පෙත්සම; සහ

(iv) මොරොන්තොට, තැඹිලිය, කන්කිරිය යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ජී. සුමනරත්න මහතාගෙන් ලැබුණු 2021.02.02 දිනැති පෙත්සම

ගරු කනක හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) කොළඹ 06, කිරුළපන, බලපොකුණ පාර, අංක 62 දරන ස්ථානයෙහි පදිංචි පී. ප්‍රේමලාල් පීරිස් මහතාගෙන් ලැබුණු 2021.02.01 දිනැති පෙත්සම;

(ii) කඳාන, කපුවාගාර පාර, අංක 441ඒ දරන ස්ථානයෙහි පදිංචි පී. වී. ඩී. ලියෝ සැම්සන් මහතාගෙන් ලැබුණු 2021.01.29 දිනැති පෙත්සම; සහ

(iii) උඩුගම්පොල, දොරණාගොඩ, අංක 125/ඒ/1 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඒ. අනුර ප්‍රියන්ත මහතාගෙන් ලැබුණු 2021.01.29 දිනැති පෙත්සම

ගරු තිස්ස අත්තනායක මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) කටුවන, තල්වත්ත, "ජයමිණී" යන ලිපිනයෙහි පදිංචි එච්. ඩබ්ලිව්. සමන් මහතාගෙන් ලැබුණු 2020.09.21 දිනැති පෙත්සම;

(ii) ඉඹුල්ගොඩ, පහළ ඉඹුල්ගොඩ, රැනගල පාර, අංක 54/15 දරන ස්ථානයෙහි පදිංචි එම්. ජී. පුංචිබණ්ඩා මහතාගෙන් ලැබුණු 2021.01.07 දිනැති පෙත්සම;

(iii) රත්නපුර, දම්බුළුවන, මාරලිය, තෙන්නකෝන් වලව්ව යන ලිපිනයෙහි පදිංචි නේමින්ද පී. පී. ඩබ්ලිව්. තෙන්නකෝන් මහතාගෙන් ලැබුණු 2020.10.25 දිනැති පෙත්සම; සහ

(iv) පල්ලේවෙල, බෝරුක්ගමුව, අංක 64 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ඒ. කේ. ඒ.වික්‍රමසිංහ මහතාගෙන් ලැබුණු 2020.08.31 දිනැති පෙත්සම

ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) පන්විල, ගල්පිහිල්ල, රජයේ නිවාස (20), අංක 07 දරන ස්ථානයෙහි පදිංචි ඒ. පී. ජී. අයි. උපුල් කුමාර මහතාගෙන් ලැබුණු 2021.01.15 දිනැති පෙත්සම;

(ii) තෙලිජ්ජවිල, උඩුකාව, පූජාවඩු ගොඩනැගිල්ල යන ලිපිනයෙහි පදිංචි කේ. පී. කරුණාදාස මහතාගෙන් ලැබුණු 2021.02.15 දිනැති පෙත්සම;

(iii) ගනේමුල්ල, කැන්දලියද්ද පාළුව, නුගහේන පාර, අංක 3ජී දරන ස්ථානයෙහි පදිංචි ආර්. එන්. තුෂාර කුලරත්න මහතාගෙන් ලැබුණු 2021.02.02 දිනැති පෙත්සම;

(iv) මීගමු පාර, කුරුණෑගල, අලකොලදෙණිය, කජ්රුකවත්ත, යටිවැහැර, අංක 12 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. පියතිස්ස මහතාගෙන් ලැබුණු 2020.12.14 දිනැති පෙත්සම; සහ

(v) කඩවත, නුවර පාර, එළිගහවත්ත, අංක 62/8 දරන ස්ථානයෙහි පදිංචි සැම්සන් කුමාරගේ මහතාගෙන් ලැබුණු 2021.02.19 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) බොරලැස්ගමුව, නීලම්මහර, අංක 158/ඒ3 දරන ස්ථානයෙහි පදිංචි සුනිල් සෙන්දනායක මහතාගෙන් ලැබුණු 2021.02.14 දිනැති පෙත්සම; සහ

(ii) උණවටුන, මාතර පාර, අංක 153/01 දරන ස්ථානයෙහි පදිංචි වයි. එල්. ලීලවංශ මහතාගෙන් ලැබුණු 2020.12.12 දිනැති පෙත්සම

ගරු ජයන්ත කැටගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(9) ගම්පහ, අකරවිට, අංක 170/බී දරන ස්ථානයෙහි පදිංචි නයනකාන්ති උපුල් කුමාරි හපුහින්න මහත්මියගෙන් ලැබුණු 2021.01.24 දිනැති පෙත්සම ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින් පිළිගන්වන ලදී.

(10) අහුන්ගල්ල, හෝටල් පාර, "සිරිසෙවන" යන ලිපිනයෙහි පදිංචි පී. ජී. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2020.12.05 දිනැති පෙත්සම ගරු සම්පත් අතුකෝරල මහතා විසින් පිළිගන්වන ලදී.

(11) රයිගම, බණ්ඩාරගම, පූජ්‍ය දියකඩුවේ ධම්මානන්ද නාහිමි මාවත, අංක 130/සී දරන ස්ථානයෙහි පදිංචි කොස්වත්තගේ සමන්ත පෙරේරා මහතාගෙන් ලැබුණු 2021.02.08 දිනැති පෙත්සම ගරු ලලිත් එල්ලාවල මහතා විසින් පිළිගන්වන ලදී.

(12) දඹුල්ල, කණ්ඩලම, ඇරැවුල හන්දිය, අංක 20 දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. සෝමාවතී මහත්මියගෙන් ලැබුණු 2021.01.26 දිනැති පෙත්සම ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් පිළිගන්වන ලදී.

(13) ජාඇල, දඩුගම, අංක 548/ සී දරන ස්ථානයෙහි පදිංචි එච්. උදේනි පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2021.01.26 දිනැති පෙත්සම ගරු නලින් ප්‍රනාන්දු මහතා විසින් පිළිගන්වන ලදී.

(14) (i) ආණමඩුව, මහඋස්වැව, මාවතගම, අංක 286 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. සුනිල් මහතාගෙන් ලැබුණු 2020.12.16 දිනැති පෙත්සම; සහ

(ii) ආණමඩුව, තෙන්නන්කුරියාව යන ලිපිනයෙහි පදිංචි ආර්. ඒ. එස්. ගෝඨාභය රූපසිංහ මහතාගෙන් ලැබුණු 2021.02.05 දිනැති පෙත්සම

ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් පිළිගන්වන ලදී.

(15) අතුරුගිරිය, මිලේනියම් සිටි, කලාප අංක 02, අංක 657 දරන ස්ථානයෙහි පදිංචි පී. ලියනගේ මහතාගෙන් ලැබුණු 2021.01.20 දිනැති පෙත්සම ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1):** ගරු ගයන්ත කරුණාතිලක මහතා, ගරු වරුණ ලියනගේ මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"බලපිටිය ශ්‍රී රාහුලාරාම පුරාණ විහාරස්ථ සාමණේර ආකල්ප සංවර්ධන භික්ෂු විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2):** ගරු උද්දික ප්‍රේමරත්න මහතා, ගරු අසංක නවරත්න මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

ඒ අනුව පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52 (6) අනුව වාර්තා කිරීම සඳහා කෙටුම්පත තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**8. රේගු ආඥාපනත යටතේ යෝජනාව:** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළෙඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— (235 අධිකාරය වූ) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු බදු සම්බන්ධයෙන් 2021.02.11 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/5 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අ. භා. 12.01 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා විසින් ගරු එච්. නන්දසේන මහතා, ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 1.30 ට ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 2.00 ට ගරු සංජීව එදිරිමාන්න මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ජල සම්පාදන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 3.06 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

''ගරු  අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය''යි නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

( අ.භා. 3.35 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**9. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 05 දිනැති අංක 2209/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**10. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2):** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 19 දිනැති අංක 2198/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**11. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය:** වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

**12. කල් තැබීම (වී සහ සහල් සඳහා සාධාරණ සහතික මිලක්):** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින් විවාද විය.

එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුයෙන් අ.භා. 5.35 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින්, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 මාර්තු 24 බදාදා පූ.භා 10.00 වනතෙක් කල් ගියේය.